1925 75 2000
පර්යේෂණ සන්දර්භයේ 75 වසරක අභිමානය
75 வருட ஆய்வின் சாதனை
75 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391-6785

දෙවන කාණ්ඩය, දෙවන කලාපය 2002 ජූනි - සැප්තැම්බර්

# පාන් කියා ගන්න වත් බැරි වෙයි ද?

ලෝකයේ තේ නිපැයුම ගැන කතා කරන විට තවමත් ලංකා තේ (Ceylon Tea) වලට හිමිවන්නේ මුල් තැනකි. එහෙත් වර්තමානයේ දක්නට ලැබෙන මහත් වූ අභියෝගවලට මුහුණ දීමට ශ්‍රී ලංකාවේ තේ වගා කරුවන්ටත් තේ නිෂ්පාදකයන්ටත්, තේ වෙන්දේසි හා අලෙවිකරුවන්ටත් දැරිය යුතු වෙහෙස අපමණ ය.

අනෙකුත් බීම වර්ග හා තේ බීම අතර තරගය ඉතා උත්සන්න වීමත්, තේ වගා කරන රටවල් අතර තරගය උච්ච ස්වභාවයට පත්ව තිබීමත්, දිනෙන් දින තේ වගාවේ ඵලදායිතාවය අගනක් රටවලට වඩා අඩු වීමත් තේ වගාවේ දී දැරීමට සිදුවන අධික පිරිවැයත් නිසා, ශ්‍රී ලංකාවේ තේ අනාගතයට යම් අහිතකර බලපෑම් එල්ල විය හැක. ලෝක වෙළඳ පොළේ ප්‍රමුඛ ස්ථානයක පැවති ශ්‍රී ලංකා තේ නිෂ්පාදන තත්වය තේ නිපැයුම සඳහා මෑතක දී පැමිණි රටවල් වන කෙන්යාව, වියට්නාමය වැනි රටවල තේ නිෂ්පාදන තත්වයන් හමුවේ බරපතල පසුබෑමකට පත් ව සිටී. එම රටවල නිෂ්පාදන වියදම අඩු වීමත් වෙළඳ පොල අවශ්‍යතාවට ගැලපෙන නිෂ්පාදන ඉදිරිපත් කිරීමත් යන කරුණු දෙක සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රයේ නියැලෙන සෑම දෙනාට ම, නැවත මේ පිළිබඳව සිතා බැලීමට කාලය එළඹ ඇත. ලෝකයේ තේ නිපදවන රටවල් අතුරින් අපගේ තේ කිලෝවක් නිපදවීමට යන මුදල ඉතා අධික ය. ඒ හේතුව නිසා ම ශ්‍රී ලංකා තේ ඉතා වැඩි මුදලකට වෙළඳ පොලේ අලෙවි විය යුතු ය. එහෙත් අප තේ අලෙවි කරනු ලබන්නේ බොහෝ දුරට ලෝකයේ අඩු ම තේ මිලක් ගෙවිය හැකි රටවල් වලට ය. එසේම එම රටවල මිල ගෙවීම පිළිබඳව ද ස්ථාවර තත්වයක් නොපවතී. මෑත පෙරදිග රටවල යුද්ධය නිසා ඇතිවන අවිනිශ්චිත තත්වයේ ප්‍රතිඵල කෙදිනක හෝ අපගේ තේ මිල කෙරෙහි ඇති කරන බලපෑම අවම කළ නොහැක.

බැලූ බැල්මට වැඩි තේ මිලක් අපගේ අමු දළු කිලෝවකට ලැබෙන බව පෙන්නුම් කළ ද එය මීට පෙර වසර වලදී අපට ලැබුණු මිල හා සංසන්දනය කිරීමේ දී එහි සත්‍ය වටිනාකම් වැඩි වීමක් නොපෙන්වයි. මෙයට ප්‍රධාන වශයෙන් ම බලපා ඇත්තේ ඩොලරයේ වටිනාකමට සාපේක්ෂව රුපියලේ වටිනාකම අඩු වීම යි.

1980 දී අපේ අමු දළු කිලෝ එකක මුදලින් ඇමරිකාවෙන් ගෙනෙන පිටිවලින් තනන පාන් ගෙඩි හතරක් මිලදී ගැනීමට අපට හැකියාව තිබුණ ද, අද දමු දළු කිලෝ එකක් අලෙවි කර අපට ලබාගත හැකි වන්නේ පාන් ගෙඩි එක හමාරක් පමණි. දැනට කරන පරිද්දෙන් ම තේ වගාව ඉදිරියට කරගෙන යන්නේ නම් පාන් ගෙඩියක් මිලදී ගැනීමට අමු දළු කිලෝ දෙකක් පමණ වැය කළයුතු කාලයක් ඉදිරියේ දී ඇතිවීම වැලැක්විය නොහැක. මෙයින් පෙනී යන්නේ, තේ කෝප්පයට පිටුපසින් සිටි පාන් ගෙඩිය එය පෙරළාගෙන ඉදිරියට ගමන් කිරීම ආරම්භ කර ඇති බවයි. එසේ ම ලෝකයේ පාන් මිල පිළිබඳවත් අපගේ තේ වලට හිමි මිල පිළිබඳවත් තත්වය එයින් පැහැදිලි වේ. මෙම උදාහරණය අපගේ තේ මිල හා එයින් මිලදී ගන්නා සියළුම භාණ්ඩ සඳහා බලපැවැත්වේ. මේ අනුව බලන කල අපගේ තේ අනාගතය එතරම් මිහිරි යැයි අනුමාන කළ නොහැක. මෙම අමිහිරි තත්වය යම්තාක් දුරකට හෝ මිහිරි කර ගැනීමට අප විසින් කළයුතු දේ ගැන සිතා බැලිය යුතුව ඇත.

අනෙකුත් ව්‍යාපාරයන් මෙන්ම තේ වගාවෙන් ද අප බලාපොරොත්තු වන්නේ උපරිම ලාභය වේ. උපරිම ලාභ ලබා ගැනීමට ආදායම උපරිම වීමත් වියදම අවම වීමත් සිදුවිය යුතුමය. තේ වගාවේ ආදායම වැඩි වීමට නම්, තේ අස්වැන්න වැඩිකර ගත යුතු අතර, තේ සඳහා ලබන මිල ද වැඩිකර ගත යුතුය. තේ අස්වැන්න යනු, තේ පඳුරකින් ලැබෙන තේ දළු ප්‍රමාණය හා දළුලක බර අතර සම්බන්ධයකි. දළු ප්‍රමාණය වැඩිවීම හා දළුලක බර වැඩිවීම, උපරිම අස්වැන්න කරා යාමට හේතුවේ. මනා ලෙස ක්‍රියාවේ යෙදවූ නිර්දේශිත කෘෂිකාර්මික ක්‍රම භාවිතය, මේ සඳහා වූ එකම මාර්ගය වේ. එසේම උසස් ගුණාත්මයකින් යුත් දළු නෙලීම ප්‍රශස්ථ තත්වයන් යටතේ ප්‍රවාහනය හා නිෂ්පාදනය, මගින් වැඩි මිලක් ලබා ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවේ.

තත්වයෙන් උසස් භාණ්ඩවලට වැඩි මිලක් ලැබීම වෙළඳ පොලේ සාමාන්‍ය සම්ප්‍රදාය වේ. මෙය අනෙකුත් ද්‍රව්‍ය වලට මෙන්ම තේ වලට ද පොදු න්‍යායකි. උසස් ගුණාත්මයෙන් යුක්ත වූ තේ නිෂ්පාදනය කිරීමට අපට හැකියාව ලැබේ නම් තේ සඳහා උසස් මිලක් ගෙවන ජර්මනිය නෙදර්ලන්තය සහ ජපානය වැනි වෙළඳ පොල කරා අපට ගමන් කිරීමට අවකාශ ලැබේ. මෙය අනිවාර්යයෙන්ම සිදුවිය යුතු ය.

ශාන්ත ජයසිංහ

තේ වගාවේ වියදම ගැන කථා කරන විට පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍යවල මිල අධික වීමත්, කම්කරුවන්ගේ හිඟ බව නිසා ඔවුනට වැඩි මිලක් ගෙවා සේවයේ යොදවා ගැනීමට ඇති අවශ්‍යතාවයත්, තේ කර්මාන්ත ශාලාවල දිනෙන් දින වැඩි වන අධික පිරිවැය අවම කර ගැනීම සඳහා කළ හැකි කාර්ය භාරය ඉතා අල්ප ය. ඒ අනුව බලන කළ තේ වල ආදායම වැඩිවීමට නම් තේ ඉඩමේ හා කම්කරුවන්ගේ ඵලදායිතාව, උපරිම මට්ටමකට ගෙන එමත් උසස් ගුණාත්මයෙන් යුතු තේ නිපදවා වැඩි මිලක් ලබා ගැනීමත් හැර කළ යුතු වෙනස් විකල්පයක් නැත.

දැන වෙළඳාම් නොදැන ගොවිතැන් යන පැරණි කියමන දැන වෙළඳාම් දැන ගොවිතැන් යනුවෙන් වෙනස්කර තේ අලෙවිය හා තේ නිෂ්පාදනය මනා ලෙස කළමනාකරණය නොකළහොත් තේ සඳහා අපට හිමිව තිබූ අද්විතීය ස්ථානයෙන් අපව බැහැරවීමත් එයින් අප උපයා ගත් විදේශීය විනිමය අපට නොලැබී යාමත් වැලැක්විය නොහැක.

මේ අනුව බලන කළ අපගේ තේ කෝප්පය රැක ගැනීමේ අවසන් විප්ලවයට මුහුණ දීම සඳහා තේ වගා කරුවන්, තේ නිෂ්පාදනය කරන්නන්, තේ තැරැව්කරුවන් තේ වෙළඳාම් කරන්නන් මෙන්ම තේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන් ද අත් වැල් බැඳ ගත යුතු කාලය දැන් එළැඹ ඇත. මේ මොහොතේ සිදුවන සුළු ප්‍රමාදයක් පවා ඉදිරියේදී මහත් පසු තැවිල්ලකට හේතුවිය හැකිය.